Copyrighted Material

# පූර්විකාව

දෙසැම්බර් මස සීතල සුළඟින් පිරි සැන්දෑවක අපරාධ අධිකරණ ගොඩනැගිල්ලෙන් පිටත ඇතිරූ කාඩ්බෝඩ්වලින් සකස් කර ගත් යහනක දිගා වී සිටි ජෝෂුවා කේන් මිනිසෙකු මරා දැමීම පිළිබඳව කල්පනා කරමින් සිටියේය. ඒ මොනයම් හෝ අහඹු මිනිසෙකු නොවේ. ඔහු කිසියම් විශේෂිත අයෙක් ගැන සිතමින් සිටියේය. උමං මාර්ගයෙන් හෝ තමා අසලින් හෝ ගමන් කරන, තම දර්ශන පථයට යොමුවුණු නමක් නොදන්නා අහඹු නිව්යෝර්ක් වැසියකු මරා දැමීම ගැනද කේන් ඉඳහිට කල්පනා කළ බව සත්‍යයකි. ඇතැම්විට ඒ, K දුම්රියේ සිට ආදර නවකතා කියවන රන්වන් හිසකෙස් ඇති ලිපිකාරිනිය හෝ මුදලක් යදිමින් කරන තමාගේ ආයාචනය නොතකා කුඩයක් වනමින් යන වෝල් ස්ට්‍රීට් බැංකුකරුවන්ගෙන් කෙනෙකු හෝ පාර හරහා ගමන් කරද්දී තම මවගේ අත අල්ලාගෙන සිටින කුඩා දරුවෙකු හෝ විය හැක.

ඔවුන්ව මරා දැමීම කෙසේ දැනේවිද? ඔවුන් සිය අවසන් හුස්ම හෙළන විට කුමක් කියනු ඇතිද? මේ ලෝකයෙන් නික්මෙද්දී ඔවුන්ගේ ඇස්වල වෙනසක් සිදු වේවිද? එම සිතිවිලි තුළ කිමිදෙද්දී සතුටක් තැවරුණු උණුසුම් හැඟීමක් කේන්ගේ සිරුරට දැනිණ.

ඔහු අත් ඔරලෝසුව දෙස බැලුවේය.

*පහයි එකොළහයි!*

ගොම්මන කෙමෙන් එළඹෙද්දී උස් තියුණු සෙවණැලි වීථි පුරා විහිදුණි. ලාම්පුවක් මතින් තිරයක් දැමූ ආකාරයෙන් තුනීවෙමින් යන ආලෝකය පිළිගනිමින් ඔහු අහස දෙස බැලුවේය. මඳ ආලෝකය ඔහුගේ අවශ්‍යතාවයට ගැළපිණ. අඳුරු වෙමින් පැවතුණු අහස ඔහුගේ මිනීමැරීමේ අදහස නැවතත් මතු කළේය.

www.musesbooks.com

Copyrighted Material



වීථියේ දිගා වී සිටි පසුගිය සති හය පුරාවටම ඔහු වෙන යමක් ගැන කල්පනා නොකළ තරම්ය. මෙම පුද්ගලයා මිය යා යුතුමදැයි ඔහු තම සිත සමඟ පැය ගණනක් වාද කළේය. මොහුගේ ජීවිතය හෝ මරණය හෝ හැරෙන්නට අනෙකුත් සියලුම දේ මේ වන විටත් ප්‍රවේශමෙන් සැලසුම් කර තිබිණි.

කේන් ඉතා සුළු අවදානමක් ගත්තේය. බුද්ධිමත්ම ක්‍රමය මෙයයි. ඔබව හඳුනා නොගැනීම අත්‍යවශ්‍ය නම් කල්පනාකාරී වීම වැදගත්ය. බොහෝ කලකට පෙර ඔහු එම පාඩම ඉගෙන ගෙන තිබිණි. මොහුට ජීවත්වීමට ඉඩ දීම අවදානම් සහගතය. අනාගතයේදී ඔවුන්ගේ ගමන් මග එකිනෙක හරහා යා වුණහොත් කුමක් කළ යුතුද? ඔහු කේන්ව හඳුනා ගනීවිද? ඔහුට ඒ සියල්ල එකිනෙක ගළපාගත හැකි වේවිද? ඔහුව මරා දැමුවහොත් කුමක් සිදු වේවිද? සෑම විටම එවැනි කටයුත්තකදී අවදානම් රැසක් මතුවන්නේය.

නමුත් කේන් එම අවදානම් සියල්ල දැන සිටියේය. ඒවා ඔහු මීට පෙර බොහෝ වාරයක් සාර්ථකව මඟහැර තිබූ අවදානම්ය.

පාරේ ඉවුර ඔස්සේ ඇදී ආ තැපැල් මලු ගෙන යන රථය කේන්ට විරුද්ධ පසින් නතර කළේය. රියදුරා - තැපැල් කාර්යාලයේ නිල ඇඳුමෙන් සැරසී සිටි, හතළිස් වන වියේ අග භාගයේ පසුවූ ශක්තිමත් පෙනුමෙන් යුතු මිනිසා - රථයෙන් බැස්සේය. *සුපුරුදු පරිදි, නියමිත වේලාවටම!* තැපැල්කරුවා, කේන්ව පසුකර යන විටදී හෝ අධිකරණ ගොඩනැගිල්ලේ සේවා පිවිසුමෙන් ඇතුළු වන විටදී හෝ වීදියේ දිගා වී සිටි කේන් පිළිබඳ සැලකිලිමත් වූයේ නැත. අනාථයින් සඳහා දීමට මාරු සල්ලි නැත. අද නැත. පසුගිය සති හයේම තිබුණේද නැත. කිසිදාක එවැනි කාසියක් ඔහු සතු වූයේ නැත. තැපැල්කරු සුපුරුදු වේලාවටම කේන්ව පසුකරගෙන යද්දී තමා ඔහුව මරා දැමිය යුතුමදැයි කේන් නැවතත් කල්පනා කළේය.

තීරණයක් ගැනීමට ඔහුට මිනිත්තු දොළහක් තිබිණ.

තැපැල්කරුවාගේ නම එල්ටන් විය. විවාහකයෙකු වූ ඔහුට ගැටවර වියේ පසුවන දරුවන් දෙදෙනකු සිටියේය. සිය කුටුම්භය මුදල් අගහිඟතාවයෙන් පෙළේ යැයි ඔහුගේ බිරිඳ සිතද්දී ඔහු සෑම සතියකටම වරක් මිලාධික අවන්හලකින් ආහාර ගත්තේය; ට්‍රයිබෙකා නගරයේ කුඩා සාප්පුවකින් අඩු මුදලකට අහුලාගත් නවකතා කියවීය. එමෙන්ම ඔහු බ්‍රහස්පතින්දා දිනවල කුණු මලු ගෙන යද්දී

MusesBooks

Copyrighted Material



ලෝම සහිත සෙරෙප්පු පැලැන්දේය. ඔහු මියයන අයුරු බලා සිටීම කෙබඳු හැඟීමක් ගෙන දෙනු ඇතිද?

මිනිස්සුන්ගේ චිත්තවේග වෙනස් වීම බලා සිටීමෙන් ජෝෂුවා කේන් සතුටු වූවේය. අහිමි වීමේ වේදනාව, ශෝකය හා බිය ඔහුට උමතුවක් මෙන් දැනුණි. මිහිමත වන හොඳම මත්ද්‍රව්‍යයක් මෙන් ඒවායින් ඔහුට සතුටක් ඇති විය.

ජෝෂුවා කේන් අනෙක් මිනිසුන් මෙන් නොවීය. ඔහුට සමාන කිසිවෙක්ද සිටියේ නැත.

ඔහු අත් ඔරලෝසුව දෙස බැලුවේය. *පහයි විස්සයි!*

ගමන ඇරඹීමට වේලාව පැමිණ ඇත.

ඔහු රැවුල කැසුවේය. මේ වන විට එය මුළුමනින්ම වැවී තිබිණි. දුහුවිල්ලෙන් හා දහඩියෙන් එහි වර්ණයට බලපෑමක් ඇති වී තිබේදැයි කල්පනා කරමින් කාඩ්බෝඩ් කැබැල්ල මතින් සෙමෙන් නැගී සිටි කේන්, පිටකොන්ද ඇදෙන සේ අතපය දිගහැරියේය. ඇඟපත එහා මෙහා වෙද්දී සිය ශරීරයෙන් හැමූ දුගඳ ඔහුගේ නාසයට දැනුණි. සති හයක් පුරාවට ඔහු කලිසම හෝ කමිසය හෝ මාරු කර නැත. ස්නානය කළේද නැත. එම ගන්ධය ඔහුගේ නාසය හකුළන්නට සමත් විය.

තම අපිරිසිදුතාවය පිළිබඳ සිතුවිල්ලෙන් සිත ඉවත් කරගැනීමට යමක් ඔහුට අවශ්‍ය විය. ඔහුගේ දෙපතුළ අසල තිබුණු, උඩු පැත්තට හැරවූ රවුම් තොප්පිය තුළ මාරු කාසිවලින් ඩොලර් කිහිපයක් තිබිණ.

ඔබ බලාපොරොත්තු වූ ආකාරයටම ඔබේ සිතැඟි ඉටුවෙමින් මෙහෙයුමක සමාප්තිය දක්නට ලැබීම තෘප්තිමත් බවක් ඇති කරයි. එසේ වුවත් මේ වතාවේදී සම්භාවිතාවයට ඉඩ දීම තුළින් තමා තුළ උද්‍යෝගිමත් හැඟීමක් ඇති වෙතැයි කේන් සිතුවේය. ඒ මොහොතේ කේන් විසින් උඩ දැමුණු කාසියකින් තම දෛවය තීරණය වූ බව එම පුද්ගලයා කිසිදාක දැනගන්නේ නැත. කේන් තොප්පියෙන් කාසියක් තෝරාගත්තේය. සුළු පහරකින් කාසිය උඩ දමා කැරකෙනු බලා සිටි කේන්, එය අත්ල මත රැඳෙන ලෙස අල්ලා ගත්තේය. ඔහුගේ සීතල ප්‍රාශ්වාස වාතය තුළ කාසිය කැරකෙද්දී, 'හිස' වැටුණොත් ඔහුව මරාදමන බව කේන් තීරණය කර තිබිණි.

තම කුණු තැවරුණු අපිරිසිදු අත මත රැඳුණු අලුත් දිලිසෙන කාසිය දෙස බලා කේන් සිනාසුණේය.

Copyrighted Material



නවතා තිබූ තැපැල් රථයට අඩි දහයක් පමණ ඔබ්බෙන් 'හොට්ඩෝග්' බනිස් අලෙවි කරන තාවකාලික කඩයක් විය. කබායක් නොපැලඳි උස මිනිසෙකුට වෙළෙන්දා සේවය සපයමින් සිටියේය. බොහෝවිට ඇප මත නිදහස් වූ අයෙක්, 'නියම කැමකින්' එය සමරනවා වන්නට ඇත. ඔහුගෙන් ඩොලර් දෙකක් ලබාගත් වෙළෙන්දා අලෙවි කුටියේ පහත වූ පුවරුව ඔහුට පෙන්වීය. ග්‍රිල් කළ සොසේජස් සහිත පින්තූරයට පසෙකින් නීතිඥයකුගේ දැන්වීමක් විය. එහි දුරකතන අංකයද සඳහන් වී තිබිණ.

**ඔබ අත්අඩංගුවට පත් වූයේද?**
**අපරාධ චෝදනාවකට ලක් වූයේද?**
**එඩී ෆ්ලින්ට කතා කරන්න.**

තැපැල් සේවකයා, අළු පැහැ සනකම රෙද්දෙන් කළ තැපැල් මලු තුනක් ඔසවාගෙන අධිකරණ ගොඩනැගිල්ලෙන් පිටතට පැමිණෙන විටම උස මිනිසා හිස සලා තම බනිසය සපමින් ඉවතට ගියේය.

මලු තුනක්! එයින් එය තහවුරු වේ.

අද නියමිත දවසයි.

සාමාන්‍යයෙන් එල්ටන් පිටතට පැමිණෙන්නේ තැපැල් මලු එකක් හෝ දෙකක් හෝ රැගෙනය. නමුත් සෑම සති හයකටම වරක් එල්ටන් තැපැල් මලු තුනක් පිටතට ගෙන එන්නේය. කේන් බලා සිටියේ එම අමතර තැපැල් මල්ල වෙනුවෙනි.

එල්ටන්, තැපැල් රථයේ පිටුපස පැති දොරේ අගුළු හැර පළමු මල්ල රථය තුළට විසි කළේය. කේන් තම දකුණු අත දිගු කරගෙන සෙමෙන් ඔහු වෙත ළං විය.

පළමු මල්ල පසුපසින් දෙවැනි මල්ලද රථයට ඇතුළු විය.

ඔහු තුන් වන මල්ල අතට ගන්නා විටම කේන් ඉක්මන් ගමනින් එය වෙත ගමන් කළේය.

"ඒයි යාළුවා, ඔයා ළඟ අමතර කාසි මොනවා හරි තියෙනවාද?"

"නෑ." කියූ එල්ටන් අවසාන මල්ලද රථය තුළට විසි කළේය. රථයේ දකුණුපස දොර වසා දැමූ ඔහු මඳ වේලාවක් වම්පස දොර අල්ලාගෙන සිටියේය. ඉන්පසු එය තමාට අයත් නොවන දෙයක් ලෙස සලකමින් විශාල හඬක් නැගෙන සේ දොර වසා දැමුවේය.

www.musesbooks.com

Copyrighted Material



කාලය මැනීම ප්‍රධාන විය. ඩොලර් කිහිපයක් අයදින ආකාරයෙන් කේන් අත දිගු කළේය. වෑන් රථයේ දොර පැමිණෙන දෙසටම අත යොමු විය. වේගයෙන් පැමිණි දොර හඬ නගමින් ඔහුගේ බාහුවේ වැදුණි.

ඔහු නිවැරැදිව කාලය මැන තිබුණේය. ලෝහ සරනේරු මස්වලට කා වදිමින් බාහුව තෙරපෙන හඬ ඔහුට ඇසුණි. අත අල්ලාගනිමින් කෑ ගැසූ කේන්, එල්ටන් තම දෑත හිසේ ගසාගන්නා අයුරු බලාගෙන බිම ඇද වැටුණේය. කම්පනය නිසා එල්ටන්ගේ ඇස් පුළුල් වී, මුව කැලඹීමට පත්ව තිබිණි. එල්ටන් දොර වසා දැමූ වේගයත්, එහි පැහැදිලි බරත් නිසා කේන්ගේ අත බිඳී ගියේදැයි සැකයක් මතු වී තිබිණ. *අවුල් සහගත විනාශයක්!*

නමුත් කේන් යනු සුවිශේෂී අයෙකි. ඔහුගේ *මමා*[1] ඒ බව නිතරම පැවසුවාය. ඔහු නැවතත් කෑගැසුවේය. බරපතළ දර්ශනයක් මවාපෑම වැදගත් බව ඔහුට දැනෙමින් තිබිණ. ඔහු කළ යුතු වූයේ අනතුරක් වූ බවට රඟපෑම පමණි.

"දෙවියනේ, ඔයාගේ අත... පරිස්සමෙන්! ඔයාගේ අත එතැන තිබුණා කියලා මම දැක්කේ නෑ. මට සමාවෙන්න!" එල්ටන් හඬ නැගුවේය. කේන් අසල දණ ගසාගත් ඔහු නැවතත් සමාව අයදින්නට විය.

"මම හිතන්නේ අත කැඩිලා." එය එසේ නොවන බව දැන දැනම කේන් කීවේය. වසර දහයකට පෙර වානේ තහඩු, කම්බි, මුරිච්චි යොදා ඔහුගේ ශරීරයේ බොහොමයක් අස්ථි පිළිසකර කර තිබිණි. ඉතිරි වී ඇති සුළු අස්ථි කොටස්ද දැඩි ශක්තිමත් බවකින් යුතු විය.

"මඟුල! මඟුල! **මඟුල!**" කළ යුත්තේ කුමක්දැයි නොවැටහුණු ආකාරයෙන් මඟ දෙපස නෙත් දුවවමින් එල්ටන් කීවේය.

"ඒක මගේ වැරැද්දක් නෙවෙයි. ඒත් මට හදිසි ප්‍රථමාධාර දෙන කෙනෙක්ට පණිවුඩයක් දෙන්න පුළුවන්."

"එපා! එයාලා මට බෙහෙත් කරන එකක් නෑ. එයාලා මාව හදිසි අනතුරු කාමරයට දායි. මට ඒ ට්‍රොලිය උඩ මුළු රෑම ඉන්න වෙනවා. ඊට පස්සේ උදේට මාව එළියට දායි. මට රක්ෂණයක් නෑ. මේ ළඟ තියෙනවා වෛද්‍ය මධ්‍යස්ථානයක්. වැඩිම වුණොත් ගොඩනැගිලි දහයක් එහායින්. එයාලා අනාථ අයට බෙහෙත්

1 මව

www.musesbooks.com

Copyrighted Material



කරනවා. මාව එතැනට ගෙනියන්න." කේන් කීවේය.

"මට ඔබව ගෙනියන්න බෑ." එල්ටන් ප්‍රතික්ෂේප කළේය.

"මොකක්?" කේන් විමසීය.

"මට මේ වාහනේ පිටස්තර අයව දාගෙන යන්න අවසර නෑ. ඔබ වාහනේ ඉස්සරහා ඉන්නවා කියලා කවුරු හරි දැක්කොත් මට මගේ රස්සාවත් නැතිවෙයි."

තැපැල් සේවකයින්ගේ නීති පද්ධතියට අනුකූලව කටයුතු කිරීමට එල්ටන් දරන උත්සාහය පිළිබඳ සහනදායි හැඟීමෙන් යුතුව කේන් සුසුමක් හෙළුවේය. ඔහු ඒ පිළිබඳව සලකා බලා තිබිණි.

"මාව පිටිපස්සට දාන්න. එතකොට කාටවත් මාව පේන්නේ නෑ." කේන් කීවේය.

වෑන් රථයේ පිටුපස කොටස දෙස මඳක් බලා සිටි එල්ටන් එහි දොර විවර කළේය. "මම දන්නෙ නෑ..."

"මම කිසිම දෙයක් හොරකම් කරන්නේ නෑ. අඩුම තරමේ කෑගැස්සෙන්නෙ නැති විදිහට මට මගේ අත හොලවන්නවත් බෑ." කේන් කීවේය. ඉන්පසු එය තහවුරු කරන ආකාරයෙන්, ආබාධයට ලක් වූ අත අනෙක් අතින් අල්ලාගෙන කෙඳිරියක් නැගුවේය.

මොහොතක පසුබෑමකින් පසු එල්ටන් එකඟ විය. "හොඳයි. ඒත් තැපැල් මලු ළඟට යන්න එපා. තේරුණාද?"

"තේරුණා." කේන් එකඟ විය.

වැටී සිටි තැනින් නැගිටීමට එල්ටන් කේන්ට උපකාර කරද්දී ඔහු කෙඳිරි ගෑවේය. එමෙන්ම එල්ටන්ගේ අත තම අත සමීපයට පැමිණියේ යැයි හැඟුණු අවස්ථාවක ඔහු කෑ ගැසුවේය. ඉන් සුළු වේලාවකට පසු තැපැල් රථයේ පසුපස යකඩ තට්ටුව මත වාඩිවුණු කේන් නැගෙනහිර දෙසට ගමන් කරන රථයේ ගැස්සීම්වලට අනුරූපව නිවැරැදි වේදනාත්මක හඬ නගමින් සිටියේය. වෑන් රථයේ පිටුපස කොටස හා ඉදිරිපස කොටස වෙන්ව පැවතිණි. එබැවින් එල්ටන්ට ඔහුව දැකිය නොහැක. බොහෝදුරට ඔහුගේ හඬ ඇසෙන්නේද නැති විය හැක. නමුත් සැකයක් ඇති නොවනු පිණිස සුදුසු පරිදි හඬ නැගීම ස්ථානෝචිත බව කේන් සිතුවේය. ආලෝකය ලැබුණේ වහලයේ වූ වර්ග අඩි හතරක් පමණ වන කැටයම් සහිත වීදුරුවෙනි.

තම කබා සාක්කුවෙන් කුඩා පිහියක් ඉවතට ගත් කේන් අධිකරණ ගොඩනැගිල්ලෙන් ගෙන ආ තැපැල් මලු තුනෙන් උඩින්ම

www.musesbooks.com

Copyrighted Material



වූ මල්ලේ බැමි කපන විටත් අධිකරණ ගොඩනැගිල්ල දර්ශන පථයෙන් ඈත් වී නොතිබුණු තරම්ය.

පළමු මල්ල වැඩකට නැත. සාමාන්‍ය ලිපි කවර පමණි. දෙවැන්නද එසේමය.

තුන් වැනි මල්ල ආකර්ෂණීය විය.

එහි වූ ලිපි කවර වෙනස් හා විශේෂිත ඒවා විය. සෑම ලිපි කවරයකම පහළ කෙළවර සිදුරු කර රතු පැහැ පටියක් අමුණා තිබිණි. එම පටියේ සුදු පැහැ අකුරින් සටහනක් තිබිණි.

මෙම ලිපිය වහා විවෘත කරන්න.
අධිකරණයෙන් නිකුත් කළ, වැදගත් කැඳවීම් ලිපියක් ඇතුළත්ව ඇත.

කේන් ඒ කිසිවක් විවර කළේ නැත. ඔහු ඒ සියල්ල බිම විසුරුවන්නට විය. එසේ කරද්දී කාන්තා නාම සඳහන් කර තිබූ ලිපි ආපසු මල්ලට දැමුවේය. මිනිත්තු භාගයක් පමණ ගතවෙද්දී ලිපි හැටක් හැත්තෑවක් පමණ ඔහු ඉදිරියේ බිම අතුරා තිබිණි. ඉන්පසු ඔහු තමා රැගෙන ආ ඩිජිටල් කැමරාව යොදාගෙන, වරකට ලිපි කවර පහක් හසුවන සේ ඡායාරූප ගෙන, කැමරාව ආපසු ඇඳුම් අතර සඟවා ගත්තේය. එක් එක් ලිපියේ ලියා ඇති ලිපින කියවා ගැනීමට, ඔහු පසු වේලාවක එම ඡායාරූප විශාලනය කර බලනු ඇත.

ඔහුගේ කාර්යය සම්පූර්ණ විය. ලිපි සියල්ල ආපසු මල්ලට දැමූ ඔහු, තමා රැගෙන ආ අලුත් ආරක්ෂක පටි යොදාගෙන තැපැල් මලු ගැටගැසුවේය. එම ආරක්ෂක පටි ලබාගැනීම එතරම් අපහසු නොවීය. ඒවා අධිකරණ කාර්යාලයේ හා තැපැල් කාර්යාලයේ භාවිත කරන වර්ගයේ ඒවාම විය.

ඉතිරි වූ කාලයේදී තම කකුල් දිගහැරගත් කේන් කැමරා තිරය මත දිස්වන ලිපි කවරවල පින්තූර නරඹන්නට විය. එහි සඳහන් කිසියම් ඡායාරූපයකින් ඔහුට නිවැරැදි පුද්ගලයා සොයාගත හැකිවනු ඇත. ඔහු එය දැන සිටියේය. ඔහුට ඒ බව දැනෙන්නේය. උද්‍යෝගය හේතුවෙන් හදවත කැලඹුණේය. එය ඔහුගේ දෙපතුලෙන් ඇරඹී පපුව හරහා කෙළින්ම ඉහළ නැඟුණු විදුලි ධාරාවක් මෙන් දැනුණි.

මැන්හැටන් හරහා ගමන් කිරීමේදී සිදුවන නිරන්තර නැවතීම් හා යළි ගමන් ඇරඹීම් නිසා රථය නවතා ඇති බව වටහාගැනීමට ඔහුට මඳ වේලාවක් ගත විය. ඔහු ක්ෂණිකව කැමරාව සඟවා

www.musesbooks.com

Copyrighted Material



ගත්තේය. පිටුපස දොර විවර විය. ව්‍යාජ අපහසුතාවයක් මවා පෙන්වමින් ඔහු ආබාධිත අත ඔසවා ගත්තේය. උපකාරය සඳහා අත දිගු කරමින් එල්ටන් වෑන් රථය වෙත නැඹුරු විය. අනතුරට පත් අත ප්‍රවේශමෙන් රඳවාගෙන සිටින බවක් හැඟවූ කේන් අනෙක් අතේ උපකාරයෙන් ඉදිරියට නැමී එල්ටන් දිගු කළ අත අල්ලාගෙන නැගී සිටියේය. එය ඉතා පහසු හා වේගවත් කාර්යයක් වන්නට ඉඩ තිබිණි. කළ යුතුව තිබුණේ වූයේ පාදයට බරදී ඉහළට එසවීම පමණි. තව සුළු බලයක් යෙදුවේ නම් තැපැල් සේවකයා වෑන් රථය තුළට ඇදී එනු ඇත. ඉතා සරල චලනයකින්, කේන්ගේ කුඩා පිහිය එල්ටන්ගේ ගෙල පිටුපස ඔස්සේ ගොස් කම්මුල් අස්ථිය හරහා කැරොටිඩ් ධමනිය වෙත යනු ඇත.

කේන් යනු වීදුරුවලින් තැනුණු අයෙක් පරිද්දෙන්, එල්ටන් ඉතා ප්‍රවේශමෙන් වෑන් රථයෙන් බැසීමට ඔහුට උපකාර කර, ඔහුව වෛද්‍ය මධ්‍යස්ථානය වෙත කැඳවාගෙන ගියේය.

උඩ දැමූ කාසියේ වැටුණේ 'අගය' පැත්තය. එල්ටන්ට කරදරයක් සිදු නොවේ.

කේන් තම ගැලවුම්කරුවාට ස්තුති කර ඔහු පිටවන අයුරු බලා සිටියේය. මිනිත්තු කිහිපයකට පසු මධ්‍යස්ථානයෙන් පිටතට පැමිණි කේන්, තමා සුවෙන්දැයි බැලීමට වෑන් රථය ආපසු පැමිණියේදැයි තහවුරු කරගැනීම සඳහා වීථිය වෙත ඇවිද ගියේය.

අවට කොතැනකවත් එය දැකිය නොහැකි විය.

MusesBooks

❂ ❂ ❂ ❂

බොහෝ වේලාවකට පසු, එම සන්ධ්‍යාවේම ව්‍යායාම ඇඳුම් කට්ටලයකින් සැරසුණු එල්ටන්, අඩක් කා දැමූ සැන්ඩ්විචයක් එක් අතකින් හා නිවසට අවශ්‍ය අඩුම කුඩුම පිරවූ කඩදාසි මල්ලක් අනිත් අතින් රැගෙන ඔහුගේ ප්‍රියතම ආහාර අලෙවි සැලකින් පිටතට පැමිණියේය. නමුත්, බිඳුණු වීදි ලාම්පුවක් යට මඳ අඳුරේ එල්ටන්ව නතර කරවමින්, මනාව රැවුල කපා, හොඳ ඇඳුමින් සැරසුණු මිනිසෙක් හදිසියේම ඔහුගේ මඟ හරස් කරමින් හිටගත්තේය.

එම සීතල සන්ධ්‍යාවේ ඇඟි හොඳ ඇඳුම් කට්ටලය හා රැවුලෙන් නිදහස් වූ ගෙල නිසා ජෝෂුවා කේන් සතුටක් අත්වින්දේය.

"මම ආපහු කාසිය උඩ දැම්මා." ඔහු කීවේය.

එල්ටන්ගේ මුහුණටම වෙඩි තැබූ කේන් අඳුරු පෙත්මඟ

www.musesbooks.com

Copyrighted Material



ඔස්සේ යුහුසුලුව ගමන් කර අතුරුදන් විය. එතරම් ක්ෂණික හා පහසු ඉවත් කිරීමක් කේන්ට සතුටක් ගෙන දුන්නේ නැත. එල්ටන් සමඟ දින කීපයක් ගත කිරීමට ඔහු කැමති වනු ඇත. නමුත් ඔහුට ඒ සඳහා කාලය ඉතිරි කරගත නොහැකි විය. ඔහුට කිරීමට බොහෝ දේ තිබිණි.

MusesBooks

www.musesbooks.com

Copyrighted Material

සති හයකට පසු...

# සඳුදා

MusesBooks

www.musesbooks.com

Copyrighted Material



# පළමු වැනි පරිච්ඡේදය

අධිකරණ කාමරයේ මට පිටුපසින් වූ බංකුවල කිසිදු වාර්තාකරුවෙක් අසුන්ගෙන සිටියේ නැත. මහජන ගැලරියේද කිසිදු ප්‍රේක්ෂකයෙක් නොවීය. සැලකිල්ලක් දක්වන පවුලේ ඥාතීන්ද නොවීය. එහි වූයේ මම, මගේ සේවාලාභියා, පැම්ෆිල්ල මෙහෙයවන්නා, විනිසුරුතුමා, ලඝුලේඛකයා සහ ලිපිකරුවා පමණි. ආහ්... උසාවියේ ආරක්ෂක නිලධාරියාද, යැංකි කණ්ඩායම සහභාගි වන තරඟයක් සිය ජංගම දුරකතනයෙන් හොර රහසේ නරඹමින් කාමරයේ කෙළවරක වාඩි වී සිටියේය.

මැන්හැටන්වල සෙන්ටර් වීදියේ පිහිටි අපරාධ අධිකරණ ගොඩනැගිල්ලේ අට වැනි මහලේ වූ කුඩා කාමරයක මම සිටියෙමි.

වෙනත් අය එහි නොසිටියේ කිසිවෙකු එම නඩුව තුට්ටුවකට මායිම් නොකළ බැවිනි. ඇත්ත වශයෙන්ම කිවහොත් පැම්ෆිල්ල මෙහෙයවන්නාද නඩුව පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්වූයේ නැත. ඔහු විසින් චෝදනා පත්‍රය කියවනු ලැබූ වහාම විනිසුරුතුමාගේ උනන්දුවද නැති වී ගියේය. *මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය භාවිතයේදී යොදාගන්නා උපකරණ ළඟ තබාගැනීම.* පැම්ෆිල්ල මෙහෙයවන්නා වූයේ නෝමන් ෆෝකීස් නමින් හැඳින්වූ, දිගු කලක් දිස්ත්‍රික් නීතිඥ කාර්යාලයේ සේවය කළ අයෙකි. නෝමන්ට විශ්‍රාම ගැනීමට තිබුණේ තව මාස හයක් පමණි. ඒ බව ඔහුගෙන් පැහැදිලිව නිරූපණය විය. ඔහුගේ කමිසයේ ඉහළම බොත්තම පියවා තිබුණේ නැත; ඇඳුම් කට්ටලය රේගන් ජනාධිපතිතුමාගේ ධුර කාලයේදී මිලදී ගත්

MusesBooks

Copyrighted Material



බවක් පෙනෙන්නට තිබිණි. ඔහු සතු වූ එකම නැවුම් දෙය ලෙස පෙනුණේ කම්මුල්වල වැවී තිබුණු දින දෙකක් පමණ පැරණි රැවුල් කොට පමණකි.

මුලසුන දැරූ විනිසුරුතුමා වන ගෞරවනීය ක්ලෙවලන්ඩ් පාර්ක්ස්ට තිබුණේ පිම්බුණු බැලුමක් වැනි මුහුණකි. හේ සිය අතක් මත හිස රඳවාගෙන විනිසුරු අසුනෙන් ඉදිරියට නැමී සිටියේය.

"අපට තව කොච්චර වෙලාවක් බලා ඉන්න වෙයිද ෆෝකීස් මහත්මයා?" විනිසුරු පාර්ක්ස් විමසුවේය.

තම අත් ඔරලෝසුව දෙස බැලූ නෝමන් උරහිස් සෙලවීය. "සමාවෙන්න ස්වාමීනි, තව සුළු මොහොතකින් එයා මෙතනට එයි."

ලිපිකාරිනිය තමා ඉදිරියේ වූ ලියවිලි එහා මෙහා කළාය. නිහඬතාවය නැවතත් කාමරය ආක්‍රමණය කළේය.

"ෆෝකීස් මහත්මයා, මම කියන දේ හොඳට මතක තියාගන්න. ඔබතුමා අත්දැකීම් බහුල නීතිඥයෙක්. ප්‍රමාද වීම තරම් මම අකමැති වෙන කිසිම දෙයක් නෑ කියලා ඔබතුමා දන්නවා ඇති කියලා මම හිතනවා." විනිසුරුතුමා කීවේය.

නෝමන් එය පිළිගනිමින් හිස සැලුවේය. ඔහු නැවත වතාවක් සමාව ඉල්ලුවේය. විනිසුරු පාර්ක්ස්ගේ ගෙල යට වර්ණය වෙනස් වීම ඇරඹෙනු දුටු ඔහු සිය කමිස කොලරය තවත් පහළට ඇද්දේය. වාඩි වී සිටීමට සිදුවන කාලය වැඩිවන තරමට විනිසුරු පාර්ක්ස්ගේ මුහුණ රතු වීමද වැඩි විය. එය ඔහුගේ කෝපය පෙන්නුම් කරන ක්‍රමයයි. හේ කිසි විටෙක ඉහළ ස්වරයකින් කතා කළේ නැත. කිසි විටෙක චෝදනාත්මක ස්වරූපයෙන් ඇඟිල්ලක් හෝ සෙලවූයේ නැත. ඔහු වාඩි වී, කෝපයෙන් දැවෙමින් සිටියා පමණි. ප්‍රමාද වීම පිළිබඳව ඔහුගේ වූ අකමැත්ත ගැන සියලු දෙනා දැන සිටියහ.

කලෙක ගණිකාවක් ලෙස කටයුතු කළ ජීන් මාරි නමින් හැඳින්වූ පනස් පස් වියැති මගේ සේවාදායිකාව මා වෙතට නැමී කොඳුරන්නට වූවාය.

"එඩී, පොලිස්කාරයා ආවෙ නැත්නම් මොකද වෙන්නේ?"

"එයා එනවා." මම කීවෙමි.

පොලිස් නිලධාරියා පැමිණෙන බව මම දැන සිටියෙමි. නමුත් ඔහු ප්‍රමාද වන බවද මම දැන සිටියෙමි.

එය එසේ වන සේ මම කටයුතු කළෙමි.

Copyrighted Material



එවැන්නක් කළ හැක්කේ පැමිණිල්ල මෙහෙයවන්නා ලෙස නෝමන් සිටින විට පමණි.

දින දෙකකට පෙර, සවස පහට මොහොතකට කලින්, වාර්තා කරන නිලධාරියා රාජකාරි අවසන් කර පිටව ගිය පසු මම චෝදනා නිෂ්ප්‍රභ කරමින් මෝසමක් ගොනු කළෙමි. ලිපි ලේඛන සකස් වී විභාගයක් පැවැත්වීමට කොතරම් කාලයක් ගතවේද යන්න පිළිබඳ හොඳ අදහසක්, වසර ගණනාවක පළපුරුද්ද විසින් මට ලබාදෙනු ලැබ තිබිණි. කාර්යාලයේ ඇති උසාවි ලිපි ගොනුගත කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අදට වඩා කලින් දිනයක විභාගයක් නොලැබෙන බව මට ස්ථිර විය. එමෙන්ම ඒ සඳහා විභාග කිරීමක් නොමැති කාමරයක් සොයා අධිකරණ කාර්යාලයද බරපතළ ගැටලුවකට මැදි වනු ඇත. සාමාන්‍යයෙන් මෝසමක් විභාගයට ගැනෙන්නේ සවස දෙකට පමණය. නමුත් විභාගයට පැය කිහිපයකට පෙර මිස, අප පෙනී සිටිය යුත්තේ කුමන කාමරයේදැයි පැමිණිල්ලේ නීතිඥයාට හෝ විත්තියේ නීතිඥයාට දැනගන්නට ලැබෙන්නේ නැත. එය ගැටලුවක් නොවේ. නෝමන්ට උදෑසන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කිහිපයක් තිබිණි. මටද එසේමය. අපගේ මෝසම එදින සවස විභාගයට ගැනෙන්නේ කුමන කාමරයේදැයි පරිගණකයෙන් පරීක්ෂා කර පවසන ලෙස උසාවි ලිපිකරුගෙන් විමසීම සාමාන්‍ය සිරිතයි. මෝසම විභාග කරන ස්ථානය පිළිබඳ තහවුරුව උසාවි ලිපිකරුගෙන් ලැබුණු පසු සිය ජංගම දුරකතනය භාවිතයෙන් තම සාක්ෂිකරුවන් අමතා පැමිණිය යුත්තේ කොතැනකටදැයි පැවසීමේ හැකියාව වෙනත් ඕනෑම පැමිණිල්ලේ නීතිඥයෙකුට ඇත. නමුත් නෝමන්ට එය අදාළ නොවේ. ඔහු ජංගම දුරකතනයක් භාවිත කරන්නේ නැත. ඔහු ඒවා ගැන විශ්වාස කරන්නේ නැත. ඔහු සිතන්නේ ඒවායෙන් අයහපත් රේඩියෝ තරංග ආකර්ෂණය කර ගන්නා බවකි.

එදින උදෑසන මහේස්ත්‍රාත් අධිකරණයේදී ඔහුව සොයාගත් මම, දහවල් නඩු විභාගය පැවැත්වෙන ස්ථානය පිළිබඳ ඔහුව දැනුවත් කිරීමට වග බලා ගතිමි. මම ඔහුට උසාවි අංකය පවසා නොතිබුණේ නම් නෝමන්ද ඔහුගේ තොරතුරු සපයන්නා මතම විශ්වාසය තබමින් ක්‍රියා කරනු ඇත. ඔහුගේ තොරතුරු සපයන්නා වන්නේ අධිකරණ කාමරයේ ඇති දැන්වීම් පුවරුවයි.

www.musesbooks.com

Copyrighted Material



දැන්වීම් පුවරුව ඇත්තේ අධිකරණ ගොඩනැගිල්ලේ දහස් වන කාමරය, ලිපිකරුගේ කාර්යාලය තුළය. එම කාර්යාලය තුළ, දඩ මුදල් ගෙවීමට සිටින මිනිසුන් පේළිවලට සමාන්තරව ඇති සුදු පැහැ පුවරුවේ එදින විභාගයට ගැනෙන නඩු හා මෝසම් පිළිබඳ ලැයිස්තුවක් සහ අදාළ කාමර දක්වා ඇත. එම පුවරුව ස්ථාපනය කර ඇත්තේ සාක්ෂිකරුවන්, පොලිස් නිලධාරීන්, දිස්ත්‍රික් නීතිඥයින්, නීති ශිෂ්‍යයන්, සංචාරකයින් හා වෙනත් නීතිඥයන් සඳහාය. ඕනෑම වේලාවක, ඕනෑම විභාගයක් පවත්වන්නේ මෙම ගොඩනැගිල්ලේ කුමන ස්ථානයේද යන්න නිවැරැදිව දැනගැනීමේ හැකියාව ඉන් ලැබේ. අපගේ මෝසම විභාගයට පැයකට පමණ පෙර මම කාමර අංක දහස වෙත ගොස්, ලිපිකරුට පසුපස හැරවෙන සේ සිටිමින් පුවරුවේ වූ මගේ මෝසම සොයාගෙන එය ඉදිරියෙන් වූ කාමර අංකය මකා අලුත් අංකයක් සටහන් කළෙමි. එය ඉතා සුළු උප්පරවැට්ටියකි. එය වනාහි, වසර දහයක් පුරාවට විජ්ජා දක්වන්නෙකු ලෙස කටයුතු කිරීමේදී මවිසින් නිරූපණය කරන ලද දීර්ඝ, අවදානම් සහගත ක්‍රියාවක් නොවීය. නීතිඥයෙකු වූ පසුවද මා ඉඳහිට මගේ පැරැණි ක්‍රමවලට යොමු වීමි.

මෙම ගොඩනැගිල්ලේ විදුලි සෝපානයක් වෙනුවෙන් කෙතරම් වේලාවක් රැඳී සිටිය යුතුදැයි දන්නා බැවින් නෝමන්ගේ සාක්ෂිකරුවා විනාඩි දහයකට වඩා වැඩි කාලයක් ප්‍රමාද කිරීමට මගේ එම සුළු වෙනස් කිරීම ප්‍රමාණවත් බව මම දැන සිටියෙමි.

අවසානයේදී, මිනිත්තු විස්සකින් ප්‍රමාද වූ පරීක්ෂක මයික් ග්‍රේන්ජර් අධිකරණ කාමරය වෙත ඇතුළු විය. පිටුපසින් වූ දොර විවර වන හඬ ඇසුණද මම හැරී නොබැලුවෙමි. විනිසුරු පාර්ක්ස් ඇඟිලි තුඩුවලින් මේසයට තට්ටු කරන වේගයෙන්ම ටයිල් පොළොව මත ග්‍රේන්ජර්ගේ දෙපා වදින හඬ මම අසා සිටියෙමි. නමුත් ඒ සමගම මට තවත් පියවර හඬක් ඇසෙන්නට විය. මා ඒ දෙසට හැරවීමට සමත් වූයේ එම හඬයි.

මිල අධික ඇඳුම් කට්ටලයකින් සැරසුණු මැදිවයසේ පුද්ගලයෙක් ග්‍රේන්ජර්ට පිටුපසින් අධිකරණ කාමරයට පිවිස පිටුපස අසුනක වාඩි විය. ක්ෂණිකව හඳුනාගත හැකි ආකාරයේ කඩාහැලෙන සුදු කොණ්ඩයක්, රූපවාහිනී දැන්වීමක බඳු කිරි සුදු දත් දෙපළක් හා කාර්යාල රාජකාරිවලම නිරත වීම හේතුවෙන් සුදුමැලි වූ සමක්ද ඔහු සතු විය. රූඩ් කාර්ප් යනු රාත්‍රී ප්‍රවෘත්තිවල සඳහන් කෙරෙන

www.musesbooks.com

Copyrighted Material



නඩු වෙනුවෙන් මාස ගණනක් වාද කරන, අධිකරණය සම්බන්ධ රූපවාහිනී වැඩසටහන්වල පෙනී සිටින, එමෙන්ම සඟරා කවරවලට පෙනී සිටිමින්ද ඒවා ආවරණය කිරීමට සහාය වන සියලුම අධිකරණ දක්ෂතාවයන්ගෙන්ද පිරිපුන් අයෙකි.

කිසිදාක මට ඔහුව මුණගැසී නැත. අපි එකම සමාජ තලයක නොසිටියෙමු. රූඩි වසරකට දෙවතාවක්වත් ධවල මන්දිරයේදී රාත්‍රී ආහාරය ලබා ගත්තේය. විනිසුරු හැරී ෆෝඩ් හා මා ලාභ ස්කොච් විස්කි පානය කළේද මසකට එක් වතාවකි. දිනක් මම මුළුමනින්ම මත් වීමි. නමුත් දැන් එසේ කරන්නේ නැත. මසකට වරක් බීම වීදුරු දෙකකට වඩා නොගන්නා තරමට මම දැන් එය පාලනය කරගෙන සිටිමි.

රූඩි මා සිටින දෙස බලා අත වැනුවේය. ආපසු හැරී ඉදිරිය බලන මට විනිසුරුතුමා පරීක්ෂක ශ්‍රේන්ජර් දෙස බලා සිටින බව දක්නට ලැබිණ. මම නැවත පිටුපසට හැරෙන විට රූඩි යළිත් අත වැනුවේය. ඔහු අත වනන්නේ මට බව මා වටහාගත්තේ එවිටය. මමද ඔහුට අත වනා ඉදිරිපසට හැරී නැවතත් නඩුවට අවධානය යොමු කිරීමට උත්සාහ කළෙමි. ඔහු මගේ අධිකරණයේ කුමක් කරන්නේදැයි මට කිසිදු අදහසක් නොවීය.

මයික් ශ්‍රේන්ජර් සෑම අතින්ම පළපුරුදු නිව්යෝක් පොලිස් නිලධාරියකු ලෙස දිස් විය. ඔහුට සැහැල්ලු ගමනක් තිබිණි. පැලඳ සිටි පිස්තෝලය ඉවත් කළ ඔහු පැමිණිලි පාර්ශ්වයේ මේසය තුළට එය දැමීමට පෙර තමාගේ මුවේ වූ බබල්ගම් හපය පිස්තෝල කොපුව තුළට දැමුවේය. උසාවිය තුළට ආයුධ ගෙන යා නොහැක. ආරක්ෂක ක්‍රමවේදවලට අනුව නීතිය ක්‍රියාත්මක කරන්නන් විසින් ආයුධ පරීක්ෂා කරනු ලැබේ. සාමාන්‍යයෙන් අධිකරණ නිලධාරීන් පළපුරුදු පොලිස් නිලධාරීන්ව පරීක්ෂා නොකළද සාක්ෂි කූඩුවට නැගීමේදී ආයුධ පැලඳ නොසිටිය යුතු බව ඔවුහුද දැන සිටියහ.

තමා ප්‍රමාද වූයේ ඇයිදැයි විස්තර කිරීමට ශ්‍රේන්ජර් උත්සාහ කළේය. විනිසුරු පාර්ක්ස් හිස සලමින් ඔහුව නතර කළේය. එය ඔහුට සාක්ෂි කූඩුවේදීම ප්‍රකාශ කළ හැක.

ජීන් මාරි සුසුමක් හෙළන හඬ මට ඇසුණි. ඇගේ කළු පැහැ කෙස් මුල්වල වූ සුදු පැහැය, කෙස්වලට යොදා තිබූ වර්ණ සේදී ගොස් ඇති බවට ඉඟි කළේය. ඕ සිය අතින් මුව වසා ගනිද්දී ඇඟිලි වෙවුලන්නට විය.

Copyrighted Material



"බයවෙන්න එපා. මම ඔයාට කිව්වනෙ, ඔයාට ආපහු හිරේට යන්න වෙන්නෙ නෑ." මම ඇයට පැවසීමි.

ඇය කළු පැහැ අලුත් ඇඳුම් කට්ටලයක් හැඳ උසාවියට පැමිණ සිටියාය. එයින් ඇයට හොඳ පෙනුමක්, තරමක ආත්ම විශ්වාසයක් ගෙන දුන්නේය.

මම ඇයව සැනසවීමට උත්සාහ කරන අතර, ග්‍රේන්ජර්ව සාක්ෂි කූඩුවට කැඳවමින් නෝමන් දර්ශනය අරඹා තිබිණි. ග්‍රේන්ජර් දිවුරුම් දුන්නේය. ජීන් අත් අඩංගුවට ගැනීම පිළිබඳ මූලික තොරතුරු පැහැදිලි කරන ලෙස නෝමන් ඔහුට පැවසුවේය.

ඔහු එදින රාත්‍රියේ 37 වැනි වීදිය හා ලෙක්සින්ග්ටන් වීදිය පසු කර යද්දී බෑගයක් අතින්ගත් ජීන්, සම්බාහන මධ්‍යස්ථානයක පිටත සිටිනු දැක ඇත. මත්ද්‍රව්‍ය සම්බන්ධව ඇයට මීට පෙරද සාපරාධී වාර්තාවක් ඇති බව ග්‍රේන්ජර් දැන සිටියේය. ඇය වෙත ගිය ඔහු සිය හඳුනාගැනීමේ ලාංඡනය පෙන්වමින් ඇයට තමාව හඳුන්වා දුන්නේය. ඔහු පැවසුවේ එම අවස්ථාවේදී ජීන්ගේ දුඹුරු පැහැ කඩදාසි මල්ලේ ඉහළින්ම මත්ද්‍රව්‍ය ගැනීමේදී භාවිත කරන උපකරණ තිබෙනු තමා දුටු බවයි.

"මේ කියන, මත්ද්‍රව්‍ය සඳහා යොදාගන්නා උපකරණ මොනවාද?" නෝමන් විමසුවේය.

"බටයක්. මත්ද්‍රව්‍ය උරන්න ඇබ්බැහි වුණු අය පුරුද්දක් විදිහට ඒවා ළඟ තියාගන්නවා. එයාගේ මල්ලෙන් ඒක එළියට ඇවිත් තියෙනවා මට මහා දවාලක වගේ පෙනුණා." ග්‍රේන්ජර් කීවේය.

විනිසුරු පාර්ක්ස් පුදුමයට පත් වූයේ නැත. නමුත් ඔහු සිය ඇස් ඉහළ නංවා ගත්තේය. විශ්වාස කළද නැතද පසුගිය මාස හය තුළදී අත්අඩංගුවට ගත් තරුණ අප්‍රිකානු අමෙරිකානු පුද්ගලයින් දුසිම් භාගයක් පමණ නිව්යෝක් පොලිස් දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිටියේ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේදී යොදාගන්නා උපකරණ ළඟ තබාගැනීමේ වරදටය. නමුත් ඔවුන් සතුව තිබුණේ ප්ලාස්ටික් කෝප්පවල දැමූ සෝඩා බීමට පාවිච්චි කරන බීම බට පමණි.

"ඉතින් ඔබ ඊට පස්සේ මොකද කළේ?" නෝමන් විමසීය.

"කවුරු හරි ළඟ මත්ද්‍රව්‍යවලට සම්බන්ධ උපකරණයක් තියෙනවා දැක්කොත් මට නම් ඒක බරපතළ වරදක් විදියට පේනවා. මත්ද්‍රව්‍යවලට සම්බන්ධ චෝදනාවක් ඒ වෙද්දිත් මාරී මෙනෙවියට තිබුණා. ඒ නිසා මම එයාගේ මල්ල පරීක්ෂා කළා. ඒක ඇතුළෙන්

www.musesbooks.com

Copyrighted Material



මත්ද්‍රව්‍ය ලැබුණා. කඩදාසි මල්ල යටම මරිජුවානා දාපු පුංචි පැකට් පහක්. ඒ නිසා මම එයාව අත්අඩංගුවට ගත්තා.”

එම ප්‍රකාශයෙන් හැඟුණේ ජීන් බන්ධනාගාර ගත කළ යුතු බවයි. *මාස දොළහක් ඇතුළත මත්ද්‍රව්‍ය සම්බන්ධ දෙවැනි චෝදනාව.* මෙවර කිසිදු සමාවක් නැත. බොහෝදුරට වසර දෙකකට හෝ තුනකට ඇයව බන්ධනාගාර ගත කෙරෙනු ඇත. නමුත් ඇත්ත වශයෙන්ම ඇය මෙම වරද සඳහා දැනටමත් දඬුවම් කාලයක් ගත කර ඇති බව මට සිහිපත් විය. ඇයව අත්අඩංගුවට ගැනීමෙන් පසු ඇය වෙනුවෙන් ශරීර ඇපයක් සූදානම් කිරීමට ඇපකරුවෙකු සොයා ගැනීමට මම උත්සාහ කරන කාලය තුළ ඇය සති තුනක් රක්ෂිතයේ සිටියාය.

මම ජීන්ගෙන් සිද්ධියේ හරය විමසුවෙමි. ඇය මට සත්‍යය පැවසුවාය. ජීන් සෑමවිටම මට සත්‍ය පවසන්නීය. පරීක්ෂක ග්‍රේන්ජර් නොමිලේම වාසියක් ලබා ගැනීමට ඔහුගේ මෝටර් රථයේ පිටුපස අසුනට ඇයව පෙරළාගෙන තිබේ. තමා දැන් ඒවා නවතා ඇති බව ජීන් කියා ඇත. එවිට මෝටර් රථයෙන් ඉවතට පැමිණි ග්‍රේන්ජර් ඇගේ මල්ල උදුරාගෙන තිබේ. එය තුළ වූ ශාක කොටස් දුටු ඔහුගේ ස්ථාවරය වෙනස් වී ඇත. මෙතැන් සිට ඇය උපයන මුදලින් සියයට පහළොවක ප්‍රතිශතයක් තමාට ලැබිය යුතු බවත්, එසේ නොවේ නම් ඕනෑම තැනකදී ඇයව අල්ලාගන්නා බවටත් ඔහු තර්ජනය කර ඇත.

තමා දැනටමත් 17 වන කොටසේ මුර සංචාරයේ යෙදෙන නිලධාරීන් දෙදෙනෙකුට සියයට දහය බැගින් ගෙවා ඇති බවත්, ඔවුන් බාරගත් රාජකාරිය නිවැරැදිව ඉටු කර නැතැයි පෙනෙන බවත් ජීන් ඔහුට පවසා ඇත. එම පොලිස් නිලධාරීන් දැනටමත් ජීන්ව හඳුනන බැවින් පහසුවෙන්ම ඇයව අතහැර වෙනත් අතක් බලාගෙන ඇත. ඇගේ පසුබිම නොසලකා හළ විට ජීන් යනු දේශ හිතෛෂි අයෙකි. ඇගේ නිෂ්පාදනය වූයේ වොෂින්ටන්වල රාජ්‍ය බලපත්‍රලාභී ගොවිපළවලින් ඍජුවම ගෙන්වන, සියයට සියයක්ම ගෘහස්ථව නිෂ්පාදනය කළ එක්සත් ජනපද මරිජුවානාය. ජීන්ගේ ගනුදෙනුකරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් ආතරයිටීස් වේදනාව සමනය කරගැනීමට හෝ ග්ලූකෝමා තත්වයෙන් සහනයක් ලබාගැනීමට හෝ දුම්පානය කළ වියපත් පිරිසයි. ඔවුන් සුපුරුදු ගනුදෙනුකරුවන් වූ අතරම ගැටලුකාරී අයද නොවූහ. ජීන්

MusesBooks

www.musesbooks.com

Copyrighted Material



ග්‍රේන්ජර්ව පලවා හැර ඇති අතර, ඔහු ඇයට චෝදනා කරමින් කතාවක් නිර්මාණය කර ඇත.

ඇත්තෙන්ම මේ කිසිවක් මට උසාවියේදී ඔප්පු කළ නොහැක. මම එයට උත්සාහ කරන්නේද නැත.

නෝමන් අසුන්ගත් වහාම නැගී සිටි මම උගුර පාදාගෙන ටයිපටිය සකස් කර ගතිමි. දෙපා මඳක් ඈතින් තබාගෙන වතුර උගුරක් පානය කළ මම ඍජුව සිටගතිමි. එයින් නිරූපණය වූයේ මම ග්‍රේන්ජර් සමග අඩුම තරමේ පැය කිහිපයක් ගත කිරීමට මාව සූදානම් කර ගන්නා බවකි. මම මගේ මේසය මත වූ ලිපිගොනුවෙන් කොළයක් තෝරාගෙන ග්‍රේන්ජර්ගෙන් පළමු ප්‍රශ්නය විමසීමි.

"පරීක්ෂකතුමනි, ඔබ ප්‍රකාශ කර සිටියා විත්තිකාරිය ඇගේ දකුණු අතින් මල්ලක් රැගෙන සිටි බව. අපි හැමෝම දන්නවා, ඒක තරමක් ලොකු දුඹුරු පාට කඩදාසි මල්ලක්. ඒක එක අතකින් නිකම්ම අල්ලගෙන ඉන්න බැරි තරම්. මට හිතෙන විදිහට ඇය මල්ලෙ උඩ තියෙන අල්ලුවෙන් අල්ලාගෙන ඉන්න ඇති?"

තමාගේ වටිනා කාලය මෙම හිස්, මෝඩ ප්‍රශ්නවලින් නාස්ති කිරීමට මූලික වූයේ මා වූ පරිද්දෙන් මා දෙස බලා සිටි ග්‍රේන්ජර් එකඟවෙමින් හිස සැලුවේය. ඔහුගේ මුව කෙළවරකින් සිනාවක් මතු විය.

"ඔව්. එයා හැන්ඩ්ල්වලින් මල්ල අල්ලාගෙන හිටියේ." ඔහු කීවේය. තමා එම ප්‍රශ්නය නිවැරැදිව යටපත් කළ බව ඔවුන්ට දිස් වන ආකාරයෙන් ඔහු පැමිණිලි පාර්ශ්වයේ මේසය දෙස බැලුවේය: නෝමන් සහ ග්‍රේන්ජර් අද දිනට අවශ්‍ය වන තරමට බීම බටවල ප්‍රයෝජන පිළිබඳ ඉතා හොඳින් සාකච්ඡා කර ඇති බව මට කිව හැකි විය. ග්‍රේන්ජර් ඒ වෙනුවෙන් වැඩිමනත් සූදානම්ව සිටිනු ඇත. බීම බට ගැන මා සමග විවාදයක යෙදීමටද ඔහු බලාපොරොත්තු වන්නට ඇත: *ඒවා සෝඩා බීමට පමණක් යොදා ගත්තේද? බිලා... බිලා... බිලා...*

වෙනත් වචනයකුදු නොපැවසූ මම අසුන්ගත්තෙමි. මගේ පළමු ප්‍රශ්නයම මගේ අවසාන ප්‍රශ්නය විය.

ගැටකපන්නෙක් තමාගේ පසුම්බිය සොරාගෙන ඇති නමුත් එය විශ්වාස කළ නොහැකි අන්දමේ බැල්මකින් යුතුව, සැකසහිත දෑසින් ග්‍රේන්ජර් මා දෙස බලා සිටිනු මට පෙනිණ. සාක්ෂිකරුවාව නැවත විභාග කිරීමට තමාට අවශ්‍ය නොවන බව නෝමන් තහවුරු

Copyrighted Material



කළේය. පරීක්ෂක ග්‍රේන්ජර් සාක්ෂි කූඩුවෙන් බැස ගියේය. නඩු භාණ්ඩ තුන ඉදිරිපත් කරන ලෙස මම නෝමන්ගෙන් ඉල්ලා සිටියෙමි.

"ස්වාමීනි, නඩු භාණ්ඩ අංක එක විදිහට තියෙන්නෙ මේ මල්ල." සාක්ෂි බහාලන, මුද්‍රා තැබූ පාරදෘශ්‍ය මල්ලක් තුළ තිබූ, ඉදිරිපස මැක්ඩොනල්ඩ් ලාංඡනය මුද්‍රණය කළ දුඹුරු පැහැ මල්ල ඔසවමින් මම කීවෙමි. ඉන්පසු බිමට නැමුණු මම මා සතුව තිබූ මැක්ඩොනල්ඩ් මල්ල අතට ගෙන සංසන්දනය සඳහා ඔසවා පෙන්වීමි.

"ස්වාමීනි, මේ මලු දෙකම නිවැරැදිවම එකම ප්‍රමාණයේ. මේ මල්ල අඟල් විස්සක් ගැඹුරුයි. මගේ උදේ කෑම එක්ක තමයි මට මේක ලැබුණේ." මම කීවෙමි.

මලු දෙකම පසෙක තැබූ මම මීළඟ නඩු භාණ්ඩය අතට ගතිමි.

"මාගේ සේවාදායිකාව අත්අඩංගුවට පත්වුණු රාත්‍රියේදී, විත්තිකාරියගේ මල්ලේ තිබුණු දේ තමයි මේ තියෙන්නෙ. නඩු භාණ්ඩ අංක දෙක."

මුද්‍රා තැබූ විනිවිද පෙනෙන මල්ලක් තුළ, කුඩා ප්‍රමාණයේ මරිජුවානා සුරුට්ටු පහක් විය. ඒ සියල්ල එක් කළද කුඩා දීසියක් පිරවීමටවත් ඒවා ප්‍රමාණවත් නොවනු ඇත.

"නඩු භාණ්ඩ අංක තුන කියන්නේ මැක්ඩොනල්ඩ්වලින් ලැබෙන සාමාන්‍ය ප්‍රමාණයේ බීම බටයක්. මේ බටය අඟල් අටක් දිගයි." එය ඉහළට ඔසවමින් මම කීවෙමි. "මේක මම අද උදේ එතැනින්ම ගත්තු, මීට සමාන බීම බටයක්." මම මාගේ බීම බටය ඔසවා පෙන්වා නැවතත් මේසය මත තැබුවෙමි.

මරිජුවානා පැකට්ටු මගේ මැක්ඩොනල්ඩ් මල්ල තුළට දැමූ මම එය විනිසුරුවරයාට පෙන්වීමි. ඉන්පසු එක් අතකින් මල්ලේ අල්ලුවෙන් මල්ල අල්ලාගෙන සිටියදී අනෙක් අතින් ගත් බීම බටය කෙළින් අතට මල්ල තුළට අත් හළෙමි.

බීම බටය දර්ශන පථයෙන් අතුරුදන් විය.

මම විනිසුරු වෙත මල්ල දුන්නෙමි. ඒ දෙස බැලූ ඔහු බීම බටය පිටතට ගෙන නැවතත් ඇතුළට දැමුවේය. ඔහු කිහිප වතාවක්ම මෙය සිදු කළේය. බීම බටය මරිජුවානා පැකට් මත කෙළින් අතට තැබුවද බටය මල්ලේ මුවවිට සිට අවම වශයෙන් අඟල් පහක්වත් පහතින් තිබිණි. මම එය කිහිප වතාවක් තනිවම පරීක්ෂා කර තිබූ

www.musesbooks.com

Copyrighted Material



බැවින් ඒ බැව් නිවැරැදිව දැන සිටියෙමි.

"ස්වාමීනි, මම උසාවි ලඝු ලේඛිකාව වෙත යොමු වෙනවා. නමුත් මගේ සටහන් අනුවත් බීම බටය ගැන පරීක්ෂක ග්‍රේන්ජර්ගේ ප්‍රකාශය වුණේ, *'එයාගෙ මල්ලෙන් ඒක එළියට ඇවිත් තියෙනවා මම මහ දවාලක වගේ දැක්කා.'* කියන එකයි. විත්තියට පෙනෙන ආකාරයට නම් මල්ලේ උඩ කොටස අකුළලා පහළට කරලා අල්ලගෙන හිටියොත් නම් එහෙම පේන්න පුළුවන්. කොහොම වුණත් එයාගෙ ප්‍රකාශයේදී පරීක්ෂක ග්‍රේන්ජර් කියනවා මගේ සේවාදායිකාව මල්ල අල්ලගෙන හිටියෙ අල්ලුවෙන් කියලා. ස්වාමිනි, මට කියන්නට ඇත්තේ එපමණයි."

විනිසුරු පාර්ක්ස් අතක් එසවීය. ඔහු ඇතිවෙන්නට මට ඇහුම්කන් දී ඇත. ඔහු සිය අසුනින් මඳක් හැරී සිය අවධානය නෝමන් වෙත යොමු කළේය.

"ෆෝකීස් මහත්මයා, මම මේ මල්ල, ඒක ඇතුළෙ තිබුණු දේවල් වගේම බීම බටයත් පරීක්ෂා කළා, පරීක්ෂක ග්‍රේන්ජර්ට මල්ල ඇතුළෙ තිබිලා බීම බටය දකින්න ලැබුණා කියන ප්‍රකාශය එක්ක මට එකඟ වෙන්න බෑ. ඒ අනුව බැලුවම එයාගේ පරීක්ෂාවට සාධාරණ හේතුවක් මට පේන්නේ නෑ. ඒ නිසා එවැනි පරීක්ෂාවක් මත රැස්කරගත්ත සියලුම සාක්ෂි නිෂ්ප්‍රභ වෙනවා. බීම බටයක්... මම කියන්නම ඕන. මෑතක ඉඳලා සමහර නිලධාරීන් බීම බටයි, තව කිසිම හානියක් නැති භාණ්ඩ කීපයකුයි, මත්ද්‍රව්‍ය සඳහා යොදාගන්න උපකරණ විදිහට වෙන් කරලා දකින ප්‍රවණතාවක් තියෙනවා. ඒ කොහොම වුණත් විත්තිකාරිය අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නුඹලට නෑ. සියලුම චෝදනා මම නිෂ්ප්‍රභ කරනවා. ෆෝකීස් මහත්මයා, මම දන්නවා ඔබට කියන්න ගොඩක් දේවල් ඇති. ඒත් වැඩක් නෑ. මට කනගාටුයි. ඔබ හොඳටම පරක්කුයි."

මාව අන්දුන් කුන්දුන් කරමින් ජීන් මාරි මගේ ගෙල වැලඳගත්තාය. මම මෘදු ලෙස ඇගේ අතට තට්ටු කර ඇයව ඉවත් කළෙමි. මගේ ගාස්තු බිල්පත ඇයට ලැබෙන විට ඇයට මාව වැලඳ ගැනීමට අවශ්‍ය නොවනු ඇත. විනිසුරුවරයා හා ඔහුගේ සගයින් උසාවි කාමරයෙන් පිට වූහ.

සිය දබරැඟිල්ලෙන් මට වෙඩි තබන ඉඟියක් පාමින් පරීක්ෂක ග්‍රේන්ජර් වේගයෙන් පිටව ගියේය. එය මට ගැටලුවක් නොවීය. මට එවැනි දේ පුරුදුය.

Copyrighted Material



"ඔබ කොයි කාලෙ වගේ ඇපීල් කරයි කියලද මම බලාපොරොත්තු වෙන්න ඕන?" මම නෝමන්ගෙන් විමසීමි.

"මේ කපේට නෑ!" ඔහු පිළිතුරු දුන්නේය. "ඔබගේ සේවාදායකයා වගේ පහත් පෙළේ අය එක්ක ග්‍රේන්ජර්ගේ ඇයිහොඳයියක් නෑ. ඔබටයි, මටයි කවදාවත් දැනගන්න ලැබෙන්නේ නැති මොකක් හරි දෙයක් මේ අත්අඩංගුවට ගැනීම පිටිපස්සේ තියෙනවා."

නෝමන් සිය ආම්පන්න එකතු කරගෙන මගේ සේවාදායිකාව පසුපසින් අධිකරණ කාමරයෙන් පිටව ගියේය. මේ වන විට කාමරයේ සිටියේ මම සහ රූඩි කාර්ප් පමණි. දක්ෂයකු වෙත පිරිනමන ආකාරයේ සිනාවක් මුවේ රඳවාගෙන ඔහු අත්පොළසන් දෙමින් සිටියේය.

රූඩි අසුනෙන් නැගී සිට මා ඇමතුවේය. "සුබපැතුම්! ඒක හරි සිත් ඇදගන්නාසුලු නඩුවක්. මට ඔබගේ වෙලාවෙන් විනාඩි පහක් ඕන."

"මොකටද?"

"මෙච්චර කාලෙකට මේ නගරේ සිදුවුණු බරපතළම මනුෂ්‍ය ඝාතනය සම්බන්ධ නඩුවේ දෙවැනි පුටුවට එන්න ඔබට ඕනද කියලා දැනගන්න."

MUSESBOOKS